# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


---

මගේ අංකය / எனது இலக்கம் / My NO: 343/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 26/02/2024 පැය 1000

## මාධ්‍ය නිවේදනය

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් - ඇල්පිටිය**

2024.02.26 වන අද දින උදෑසන කාලයේ ඇල්පිටිය පොලිස් වසමේ පතිරාජ වත්ත ප්‍රදේශයේ නිවසක සිටි පුද්ගලයෙකුට යතුරු පැදියකින් පැමිණි නාදුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් වෙඩි තබා ඝාතනය කර ඇති බවට ඇල්පිටිය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 51 ක් වු පතිරාජ වත්ත ප්‍රදේශයේ පදිංචි මහජන සෞඛ්‍ය පරික්ෂකවරයෙකු බවට අනාවරණය වී ඇත.**

මෘතශරීරය සිද්ධිය වු ස්ථානයේ ඇති අතර පිස්තෝල අවියකින් මෙම වෙඩි තැබීම සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශන අනුව අනාවරණය වී ඇත. මරණකරු ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ භාණ්ඩාගාරික වශයෙන්ද කටයුතු කර ඇති බවට අනාවරණය වී ඇත. පලාගිය සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ඇල්පිටිය පොලිසිය විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**